# <u>දැන්වීමයි</u>

## තාවකාලික/හදිසි ගමන් බලපත්‍ර (NMRP) නිකුත් කිරීම

ඉතාලිය, ඇල්බේනියාව, ග්‍රීසිය, සැන් මැරිනෝ සහ මෝල්ටාව යන රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන් හට, එක් වරක් පමණක් ශ්‍රී ලංකාවට යාමට හැකි තාවකාලික/හදිසි ගමන් බලපත්‍ර නිකුත් නිකුත් කරනු ලබන්නේ පහත දැක්වෙන හේතු මත ඉදිරිපත් කරන අයදුම්පත් සඳහා පමණි.

- පවුලේ සමීප ඥාතියෙකුගේ අවමංගල්‍යයකට සහභාගී වීමට හෝ සමීප ඥාතියෙකුගේ හදිසි රෝගී තත්වයක් හේතුවෙන් ශ්‍රී ලංකාවට යාමට
- අයදුම්කරුගේ කිසියම් රෝගී තත්වයක් සඳහා හදිසි ප්‍රතිකාර ගැනීමට

තාවකාලික/හදිසි ගමන් බලපත්‍ර (NMRP) නිකුත් කරනු ලබන්නේ හදිසි කටයුත්තක් සඳහා එක් වරක් ශ්‍රී ලංකාවට යාම සඳහා පමණක් වන අතර, අදාළ ගුවන් ගමන සඳහා පමණක් භාවිතා කළ යුතු වේ. එය, සාමාන්‍ය ගමන් බලපත්‍රය භාවිතා කර සිදුකරනු ලබන වෙනත් කිසිදු කටයුත්තක් සඳහා වලංගු නොවේ.

ඉහතින් සඳහන් කරන ලද හේතුන් මත ලංකාවට යාම සඳහා තාවකාලික/හදිසි ගමන් බලපත්‍ර නිකුත් අයදුම් කිරීමේදී පහත සඳහන් ලේඛන ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

1. නිසිපරිදි සම්පූර්ණ කරන ලද කේ35 අයදුම්පත්‍රය හා හදිසි ගමන් බලපත්‍ර ඉල්ලීමට අදාළ අයදුම්පත්‍රය
2. මෑතකදී ලබාගත් පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02
3. වර්තමාන ගමන් බලපත්‍රය
4. ගමන් බලපත්‍රය නැතිවී හෝ සොරාගෙන ඇති විටදී ඊට අදාළ පොලිස් පැමිණිල්ල
5. උප්පැන්න සහතිකයේ මුල් පිටපත
6. ශ්‍රී ලංකා ජාතික හැඳුනුම් පත්‍රය (අනිවාර්ය නොවේ)
7. හදිසි ගමන් බලපත්‍රයක් අයදුම්කිරීමට හේතුවූ කරුණ තහවුරු කිරීම සඳහා සාක්ෂ ලේඛන (උදා: වෛද්‍ය සහතික ආදිය)
8. රැඳී සිටීමේ බලපත්‍රය
9. තහවුරු කරන ලද ගුවන් ටිකට්පත
   ඉහත 3 සිට 8 දක්වා වන ලේඛන වල ඡායාපිටපතක් බැගින් ද ඉදිරිපත් කළ යුතු වේ

**ඉහත රටවල වෙසෙන සියළුම ශ්‍රී ලාංකිකයන් සිය ගමන් බලපත්‍රය කල් ඉකුත්වීමට මාස 06කට ප්‍රථමයෙන්, නව ගමන් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කර ලබා ගැනීම මගින් එම රටවල රාජ්‍ය ආයතන හා ගණුදෙනු කිරීමේදී, විවිධ බලපත්‍ර අළුත් කරගැනීමේදී මෙන්ම හදිසි ගුවන් ගමන්වල යෙදීමේදී ද සිදුවන අපහසුතා මගහරවා ගැනීමට හැකිවනු ඇත.**

**ශ්‍රී ලංකා තානාපති - රෝමය**

2019 නොවැම්බර් මස 15 වන දින